# වේගිරිය පූර්ව බ්‍රාහ්මී අභිලේඛනයෙන් හෙළිවන පූර්ව ඓතිහාසික යුගයේ සුළු කර්මාන්ත

ගම්පොළ විජය හිමි

පුරාවිද්‍යා අධ්‍යයනය අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. gampolavijayathero@gmil.com

ප්‍රමුඛ පදඃ වේගිරිය කන්ද ලිපිය, පූර්ව ඓතිහාසික, සුළු කර්මාන්ත

## හැඳින්වීම

වේගිරි කන්ද පුරාවිද්‍යා ක්ෂේත්‍රය අවට කලාපයේ පූර්ව ඓතිහාසික හා ඓතිහාසික යුගයන්හි විවිධ කර්මාන්ත සිදු කළ ප්‍රදේශයක් වූ බවට වේගිරිය පූර්ව බ්‍රාහ්මී අභිලේඛන අන්තර්ගතයෙන් ගම්‍ය වේ. අභිලේඛනයේ අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී, ප්‍රදේශය ආශ්‍රිත ව මූල ඓතිහාසික හා ඓතිහාසික අවධියේ ජීවත් වූ විවිධ කුල ශ්‍රේණි පිරිස් හා කර්මාන්ත පිළිබඳ ඉස්මතු කරනු ලැබේ. යථෝක්ත අභිලේඛනයේ, *කුඹකර, චුඩකර, දටික* ආදි කර්මාන්ත පිරිස් නාමයන් පිළිබඳ අන්තර්ගතය. යථෝක්ත ශිල්පීන්ගේ ග්‍රාමයන් වේගිරි කන්ද පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ආසන්නයේ පිහිටා තිබූ බවට උපකල්පනය කළ හැකිය. වර්තමානයේ පවා පුරාවිද්‍යා ක්ෂේත්‍රය අවට කලාපයේ ඇතැම් කර්මාන්ත සිදු කරනු ලැබේ. මේ අනුව මූල ඓතිහාසික හා ඓතිහාසික යුගයන්හි කලාපයේ පැවැති සුළු කර්මාන්ත පිළිබඳ පූර්ව බ්‍රාහ්මී අභිලේඛනයේ අන්තර්ගතයෙන් විමසීමට බඳුන් කළ යුතුය.

## ක්‍රමවේදය

පර්යේෂණයේදී දත්ත එක්රැස් කිරීම ප්‍රධාන ක්‍රමවේද හතරක් යටතේ සිදු කරනු ලැබීය. සාහිත්‍ය මූලාශ්‍ර පරිහරණය, ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා හා සිතියම් අධ්‍යයනය යන ක්‍රමවේදයන් භාවිතයට ගෙන දත්ත රැස්කරනු ලැබේ. සාහිත්‍ය මූලාශ්‍ර පරිහරණයේදී ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතික මූලාශ්‍ර පරිහරණය සිදු කර ඇත. ග්‍රාමයේ දැනට ජීවත්ව සිටින පැරණි සාමාජික සාමාජිකාවන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ඔස්සේ ද දත්ත එකතු කරන ලදි. උක්ත විවිධ ක්‍රමයන් භාවිතයෙන් එක්රැස් කරගත් දත්ත ක්‍රමානුකූලව විධිමත් ආකාරයෙන් වර්ගීකරණය කර ගැනීමට හැකි විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

- **කුඹල් කර්මාන්තය**

වේගිරි කන්ද පූර්ව බ්‍රාහ්මී අභිලේඛනයේ අන්තර්ගතය ඇසුරෙන් ප්‍රදේශය ආශ්‍රිත ව කුඹල් කර්මාන්තය පැවැති බවට ගම්‍යවේ. එහිදී *'කුඹකර'* යනුවෙන් ක්‍රිස්තු පූර්ව 03 වන සියවසට පෙරාතුව කලාපයේ ජීවත් වූ කුඹල්කරුවන් පිළිබඳව අභිලේඛනයේ සඳහන් වේ. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ට සාපෙක්ෂව සාහිත්‍යය මූලාශ්‍රයන්හි බහුල වශයෙන් කුඹල් කර්මාන්තය පිළිබඳ සඳහන් වේ. මැටි බඳුන් නිර්මාණ කිරීම සඳහා භාවිත කරන *'සකපෝරුව'* සාහිත්‍යය මූලාශ්‍රයන්හි දක්වා ඇත්තේ *'කුළාලචක්ක'* යනුවෙනි. අභිලේඛන ආශ්‍රිත ව ඉතා අල්ප වශයෙන් කුඹල් කර්මාන්තය පිළිබඳව සඳහන් ව ඇත. වේගිරිය පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයට අනුව කුඹල්කරු සෝණයන් පිළිබඳ සඳහන් වේ. 'සෝණ' යනු නාමයක් පමණක් වන අතර තත් පුද්ගල නාමය විශේෂ කොට දැක්වීමට හෝ ඔහුගේ ගෞරවනීය තත්වය පිළිබිඹු කිරීමට

'කුඹකර' යන්න භාවිත කළ බව ගම්‍ය වේ. අභිලේඛනයට අනුව අර්ථකථනය කිරීමේදී මෙම ප්‍රදේශය ආශ්‍රිතව පූර්ව ඓතිහාසික යුගයේ කුඹල් කර්මාන්තය ප්‍රමුඛ වූ කර්මාන්තයක් වශයෙන් පැවැති බවත් 'කුඹල්කරුවා' යනු සමාජයේ වැදගත් පුද්ගලයෙකු වූ බවකි. වර්තමානයේ යම් ලෙසකට පහල කුලවලට අයත් පිරිස් වශයෙන් කුඹල් කර්මාන්තයේ යෙදන පිරිස හඳුන්වනු ලැබුවද පූර්ව ඓතිහාසික යුගයේ ගෞරවනීය තත්වයක් සහිත වූ පිරිසක් වශයෙන් කුඹල්කරුවන් හඳුන්වා ඇත. වර්තමානයේ ප්‍රාදේශීය කුඹල් කර්මාන්තය දෙස බැලීමේදී වේගිරිය බටහිර, කුඹල්වෙල, කොටගල්ඕලුව ආදී ග්‍රාම කිහිපයක කුඹල් කර්මාන්තය සුළු වශයෙන් සිදු කරන බවක් දක්නට ලැබෙන අතර වේගිරිය හා අවට ග්‍රාමයන් කිහිපයක විශාල වශයෙන් මැටි ගඩොල් නිෂ්පාදනය වර්තමානයේ පවා සිදු කරන බවක් දක්නට හැකිය. මේ අනුව ගම්‍ය වනුයේ අතීතයේ මෙන්ම වර්තමානයේද මැටි කර්මාන්ත ආශ්‍රිත වූ නිෂ්පාදනයන් තත් කලාපය තුළ සිදු වූ බවකි.

- මැණික් කර්මාන්තය

වේගිරි කන්ද පූර්ව බ්‍රාහ්මීය අභිලේඛනයේ අන්තර්ගතය ඇසුරෙන් හෙළිවන ආර්ථික තත්ත්වය පිළිබඳ සඳහන් කිරීමේදී මැණික් කර්මාන්තය තත් ප්‍රදේශය ආශ්‍රිත පැවැත ඇත. එම කරුණ සනාථ කිරීමට හැකි සාධකය වනුයේ පූර්ව බ්‍රහ්මීය අභිලේඛනයේ අන්තර්ගත වන ' *මණිකර* ' නාමයයි. මැණික් කර්මාන්තය සිදු කළ පිරිස් අවට ප්‍රදේශයේ ජීවත් වූ බවක් ගම්‍ය කරනු ලැබේ. අභිලේඛනවල සඳහන් වන මණිකර නාමය මැණික් නිර්මාණ කිරීම සඳහාම භාවිතා වූ බවක් ගම්‍ය නොකරනු ලැබේ. අර්ධ වටිනාකමකින් යුක්ත පාෂාණ භාවිත කරමින් විවිධ නිර්මාණ සිදු කළ පිරිස සඳහා මෙම නාමය භාවිත කරන්නට ඇති බව සුදර්ශන් සෙනවිරත්නගේ මතය වේ. මාතලේ හා මහනුවර කලාපය ආශ්‍රිත බහුල වශයෙන් මැණික් කර්මාන්තය සඳහා උචිත වූ අමුද්‍රව්‍ය අන්තර්ගතය. ගලහ ආශ්‍රිත ව දක්නට හැකි තිරුවාන නිධිය භාවිත කොට සුදුසු වූ අමුද්‍රව්‍ය සපයා ගැනීමට හැකිය. ලංකාවේ උස්බිම් සංකීර්ණයේ විපරීතකරණයට පත් වූ පාෂාණ අන්තර්ගතයන් තුළ බහුල වශයෙන් අර්ධ වටිනාකමින් යුක්ත පාෂාණ හඳුනා ගැනීමට හැකිය. සුදර්ශන් සෙනවිරත්න ප්‍රකාශ කර සිටින්නේ මධ්‍ය කඳුකරයේ සුලභව හමුවන අඹතේස්ත, ෆෙල්ස්පාර්, තලාතු මිනිරන් වැනි අර්ධ වටිනාකමින් යුක්ත වූ පාෂාණ වලින් නිර්මාණය කළ පබළු හා ආභරණ වැනි දෑ ඉබ්බන්කටුව මෙගලිතික සුසාන ආශ්‍රිතව හමුවන බවයි.

- ඇත්දළ කර්මාන්තය

ඇත්දළ කර්මාන්තය පිළිබඳ විවිධ පුරාවිද්‍යාත්මක සාධක හමුවුවද ඇත් දළ කර්මාන්තය සිදු කළ බවට ගම්‍ය කරනු ලබන අභිලේඛන සාධක අවම මට්ටමක පවතියි. මේ අනුව ලංකාව පුරා විහිදී ඇති ශිලා ලේඛන අතුරින් වේගිරි කන්ද පූර්ව බ්‍රහ්මී අභිලේඛනයේ ඇත්දළ නිර්මාණකරුවන් පිළිබඳ සඳහන් වනු ලැබේ. '*දතික*' යනුවෙන් සඳහන් කරන අභිලේඛනයේ ඇත්දළ නිර්මාණකරුවා යන අරුත් ගන්වා ඇත. තත් කලාපය ආශ්‍රිත ව මෙම ඇත්දළ නිර්මාණ සිදු කරන පිරිස ජීවත් වූයේ නම් අමුද්‍රව්‍ය සපයා ගැනීම සිදු කරගනු ලැබුවේ කුමන ආකාරයෙන් ද යන්න විමසීමට බඳුන් කළ යුතුය. ඇත්දළ යනු දුර්ලභ වූ ද්‍රව්‍යයක් වන අතර මෙය ලබා ගැනීමට නම් ඇතුන් සිටින ප්‍රදේශ කරා ගමන් කළ යුතුය. ප්‍රාදේශීය ජනයාගේ මතවාදයන්ට අනුව, තත් කලාපයේ විවිධ වූ කර්මාන්ත කළ පිරිස් අතීතයේ ජීවත් විය. ග්‍රාම වාසීන්ගෙන් ලද තොරතුරු මගින් ක්‍රිස්තු පූර්ව යුගයේදී ඇත්දළ කර්මාන්තය සිදු කළේ යැයි උපකල්පනය කළ හැකි ප්‍රදේශ කිහිපයක් හඳුනා ගැනීමට හැකි

විය. ප්‍රදේශයේ වර්තමානයේ මෙම කර්මාන්ත වල නිරත පිරිස ප්‍රදේශයේ දක්නට නොහැකි වුව ද අතීතයේ ලී කැටයම් හා තත් නිර්මාණ ආදීය සිදු කළ පිරිස වර්තමානයේ පවා මේ ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වේ.

වර්තමානයේ විශාල වශයෙන් සුළු කර්මාන්තවල නිරත වන පිරිස් වේගිරිය අවට කලාපයේ ව්‍යාප්තව ඇති බවක් දක්නට ලැබේ. පිත්තල කර්මාන්තයේ යෙදෙන පිරිස් පිළිමතලාව, ආදි ප්‍රදේශ ආශ්‍රිත දක්නට ලැබේ. මෙම අවට කලාපය ඇතුළු ප්‍රදේශයන්හි ඒ ඒ කර්මාන්ත සඳහා වෙන් වූ ග්‍රාමයන් ක්‍රිස්තු පූර්ව යුගයට පූර්වයේ සිටම පැවැත ඇති බවක් උපකල්පනය කළ හැකි අතර වර්තමානය වන විට අතීත කර්මාන්ත පරිහානියට පත්ව සමාජ අවශ්‍යතාව අනුව නව කර්මාන්ත බිහිව ඇති බවක් ගම්‍ය වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ


Paranavitana, S. (1970) ***Inscriptions of Ceylon Vol I,*** Colombo: Archaeological Survey Department.

සෙනෙවිරත්න, සුදර්ශන් (2013) *උත්තර මලය රට්ඨයේ ප්‍රාථමික යකඩ යුගයේ ඛනිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව.* **මලය රට පුනරාවලෝකනය.** සංස්: ජයරත්න,ඩී.කේ.; ඒ.ජී. දයාවති, මහනුවර: මධ්‍යම සංස්කෘතික අරමුදල,

රඹුක්වැල්ල, සී. (1996) *මහනුවර හා තදාසන්න ප්‍රදේශ ආශ්‍රිත ජනාවාස පසුබිම,* ක්‍රි.පූ. 03 වන සියවසේ සිට ක්‍රි.ව. 03 වන සියවස දක්වා. **ඓතිහාසික මහනුවර.** සංස්: ගොඩගම මංගල හිමි, මහනුවර: ශ්‍රී සුමංගල විද්‍යාලය

මෙන්ඩිස්, තුසිත (2003). *අපේ සම්පත් පරිහරණයේ ඉතිහාසය. වැලිපිළ පුරාවිද්‍යා සඟරාව* **(පස්වැනි කලාපය).** සංස්කරණය: ඉනෝකා දමයන්ති බාලසූරිය සහ ඩබ්ලිව්. වීරසිංහ, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.